# සිංහල සිනමාවේ සෙනසුරු මාරුව

එංගලන්තයේ අධ්‍යාපනය ලැබූ ලෙස්ටර් තම සිනමා ජීවිතයේ මූලය පටන් ගන්නේ ශ්‍රී ලංකාවේ පිටිසර ගම්මානයක නිදහස් සුව විඳිමිනි. එදා සිනමාව ඉන්දියානු සම්භවයක් සහිත ද්‍රවිඩ සිනමා කර්මාන්ත ශිල්පීන් හා නිෂ්පාදන සමාගම් සමග බද්ධ ව චිත්‍රාගාරවල දර්ශන තල හා දෙමළ හින්දි චිත්‍රපටවල කාබන් කොපි මත යැපෙමින් තිබූ යුගයක ඔහුගේ රේඛාව සිංහල සිනමාවට සැබෑම රිදී රේඛාවක් විය. ගම්බද පරිසරයේ වෙල් ඉපනැල්ලේ හිරු එළියේ තම කැමරා ආම්පන්න අටවාගත් ලෙස්ටර් එදා ප්‍රේක්ෂක ජනතාවට සිංහල චිත්‍රපටියක් පෙන්වීය. එහෙත් එදා සජීවී දර්ශනතලවල සුන්දර සිංහල සිනමාව නැරඹීමට අපේම ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකයන් සිනමා ශාලාවලට රොක් වූයේ මඳ වශයෙනි. මල්වතුවල සිංදු නැති සටන් නැති රේඛාව එදා සාමාන්‍ය ප්‍රේක්ෂක ජනතාවට "බෝරින්" චිත්‍රපටියක් විය. එහෙත්




ලක්ෂ්මන් කොඩිතුවක්කු

එනයින් ලෙස්ටර් තම සිනමා චාරිකාව අත් හැරියේ නැත. රේඛාවෙන් පසු විශිෂ්ඨ ගණයේ චිත්‍රපට රාශියක් බිහිකළ ලෙස්ටර් ගම් පෙරළිය චිත්‍රපටිය තුළින් ඉන්දියාවේ රජත මයුර සම්මානය දිනුවේය. ඔහුගේ නිධානය චිත්‍රපටිය ලොව විශිෂ්ඨ ගණයේ චිත්‍රපටියක් ලෙස ලෝක සම්මානයට පාත්‍රවිය. එදා ලෙස්ටර්ට මේ ගමන යන්නට විශාල පිරිසක් දායක වූ බව අවිවාදිතය. තේ පැන් සැපයූ ටී බෝයි ගේ සිට කාර්මික ශිල්පීන්, සංගීත ශිල්පීන් තිරනාටක ශිල්පීන් දෙබස් රචකයන්, සංස්කරණ කැමරා ශිල්පීන් ආදී ප්‍රතිභාපූර්ණයන් රැසකගේ දායකත්වය මැදින් සිංහල සිනමාවේ විශාල වෙනසකට මුල පිරූ ලෙස්ටර්ට තම සිනමා ජීවිතයේ අමතක කළ නොහැකිම ප්‍රතාපවත් චරිතයක් ඇත. ඒ තිස්ස අබේසේකරයන්ය. ලෙස්ටර් ගේ සිනමා නිර්මාණ රැසකට දෙබස් හා තිරනාටක තුළින් තම උපන් හපන්කම් දැක්වූ තිස්ස අබේසේකරයන්ගේ අවසාන තිරපිටපත වූයේ සෙනසුරු මාරුවයි. එහෙත් ඔහු තම අතින් ලියවුණු අවසාන නිර්මාණය නරඹන්නට තරම් වාසනාවන්ත වූයේ නැත.

සෙනසුරු මාරුව උදය කාන්ත වර්ණසූරිය නැමැති ප්‍රවීණ සිනමා ශිල්පියා අතට පත්වන්නේ අහම්බෙනි. ඒ තිස්ස අබේසේකරයන් මුණ ගැසීමට ගිය මොහොතකයි. කලකට පෙරදී තමා අතින් ලියවුණු මෙම තිරනාටකය ඔහු උදයකාන්තට බාර දෙන්නේ සෙනසුරු මාරුව නමින් නොවේ. වෙන නමකිනි. තිස්ස අබේසේකරයන් ලෙස්ටර් වෙනුවෙන් නිර්මාණය කළ තිර නාටකවලදී නිධානය චිත්‍රපටියට හිමිවන්නේ ප්‍රබල ස්ථානයකි. එය පී.බී. සේනානායක ප්‍රවීන ගත් කතුවරයාගේ කෙටි කතාවකි. එසේම තිස්සගේ දෙබස් හා තිර නාටකයත්, කේමදාසගේ සංගීතයත් එකතු වූ තැන බිහිවන විශිෂ්ඨත්වය තුළින් නිධානය, සිංහල සිනමාවට නිධානයක්ම විය.



එසේම තිස්ස විසින්ම තිරනාටකය දෙබස් ලියා අධ්‍යක්ෂණය කළ මාර්ටින් වික්‍රමසිංහයන්ගේ විරාගය තුළින් ඔහු සැබෑම අරවින්දයන් ප්‍රේක්ෂකයා හමුවේ නිරූපනය කිරීමට සමත් වූයේය.
අපේ සිංහල සිනමාවට මැද මාවත හඳුන්වාදුන් එච්. ඩී. ප්‍රේමරත්න නිර්මාණකරුවාගෙන් පසු ඒ ගමන් මඟ යන අධ්‍යක්ෂකවරයා උදයකාන්ත යැයි කිවහොත් එහි වරදක් නැත. රාජ්‍ය සේවය පිණිසයි චිත්‍රපටිය තුළින් අමුතුම පෙරළියක් කළ උදයකාන්ත සිංහල සිනමාවට අවතීර්ණ වූයේ අනුර හොරේෂස් විසින් දිවයිනට ලියූ ලිපි පෙලක් මගින් සම්පාදනය කළ ගිනි අවි හා ගිනි කෙළි නවකතාව අධ්‍යක්ෂණය කරමිනි. ඊට පසු බහු භාර්යා, බහු භූතයෝ රන් කෙවිට වැනි මැද මාවතේ චිත්‍රපට රාශියක් නිර්මාණය කළ උදයකාන්ත සරල කලාත්මක චිත්‍රපට නිර්මාණකරණයේ ලා බොහෝ දස්කම් ඇති නිර්මාණශීලී අධ්‍යක්ෂවරයෙකි. ප්‍රසන්න විතානගේ, අශෝක හඳගමගේ වැනි සිංහල සිනමාවෙ ගමන් මග වෙනසකට පත් කල අධ්‍යක්ෂකවරුන් මෙන් ජාත්‍යන්තර තලයේ නිර්මාණ චාරිකාවක නොයෙදුනද, ශ්‍රී ලාංකික සිංහල ප්‍රේක්ෂක පිරිස් ආකර්ෂණය කරගතහැකි අපූරු විස්කම් සහිත සිනමා ශිල්ප ඥාණයක් උදයකාන්තට හිමිය. ඔහු සිංහල ප්‍රේක්ෂක රසඥතාවය හා හැඩ තල හඳුනන අධ්‍යක්ෂවරයෙකි.

තිස්ස ලියූ සෙනසුරු මාරුව ආරම්භ වන්නේ තිසල් නැමැති නැවක සේවය කළ මරා දැමූ චරිතය, කටුනායක ගුවන් තොටුපළ හරහා ලංකාවට පැමිණෙන දර්ශනයකිනි. තිසල් ලංකාවට පා තබන්නේ ඔහු සමඟ එක්ව නැවේ එදා සේවය කළ තමා මරා දමා දියමන්ති පහැරගත් ඒ වනවිට කෝටිපතියෙකු වී සිටින තම පසමිතුරා මුණගැසීමටය. මොවුන් දෙදෙනාම එකතු වී මරා දමන ලද ජපන් ජාතිකයා ළඟ තිබූ දියමන්ති පාර්සලය පිළිබඳව තන්හාවක් ඇතිවන තිසල්ගේ මිතුරා තිසල්වද මරා දමා දියමන්ති පාර්සලය පැහැරගත්තද, මාරාන්තිකව පහර කා මුහුදට වැටෙන තිසල් මිය නොයයි. එහෙත් මේ දියමන්තිවල සැබෑම හිමිකරුවා කවුද යන ප්‍රශ්නයට ප්‍රේක්ෂකයන් මුහුණ දුන්නද ඔවුන් තිදෙනාම එක්වී කළ ව්‍යාපාරයක් වශයෙන් සඳහන් කර එයින් ලිස්සා යාම නිසා එම ගැටළුව තරමක් දුරට නිරාකරණය කරගැනීමට උදයකාන්ත සමත් වෙයි. තම ජීවිතය බේරාගත් තිසල් එදා මිතුරාවූ සතුරාගෙන් ඔහුට හිමි කොටස වෙනුවෙන් ඉල්ලා සිටින විශාල වන්දි මුදල වෙනුවට අවසානයේ ප්‍රාණ ඇපකාරියක් වන්නේ සතුරාගේ අහිංසක දියණියයි. දියණියගේ දුප්පත් අහිංසක පෙම්වතාද පන්නා දමා ඇමතිවරයකුගේ පුතෙකුට තම එකම දෝනිය සරණපාවා දෙන්නට සූදානම් වන හතුරුතෙමෙ ඒ ඇමතිවරයාගේ දේශපාලන හයි හත්තියෙන් ඉහළට යාමට උත්සහ කරන්නෙකි. එසේම පාතාලය ඇසුරු කරන ඇමතිවරයා හා ඇමතිවරයාගේ සල්ලාල ප්‍රචණ්ඩ පුතා සමඟ එක්ව තිසල්ව විනාශ කිරීමට තැත් කරන සතුරාගේ අවසාන සටන නතර වන්නේ උතුරේ පුදුමාතලන් මුහුදු තීරයේ එදා කොටින් විනාශ කළ අබලන් පාරා නෞකාව ඇතුළතදීය. එම සටන නවීන ආයුධවලින් සමන්විත කොටින්ගේම යුද්ධයක් හා සමානය. කතාව ආරම්භයේ කිසිවෙකුත් නැතිව හුදකලා සටනක




නිරතවන තිසල්ට අවසානයේ නවීන අවි ආයුධවලින් සමන්විත ආරක්ෂකයන් ද සිටී. එම අවසාන සටනින් ඇමති පුතා මියගොස් තිසල්ගේ අතකට වෙඩි වැදී ඔහු ජීවිතය බේරාගනී. වෙඩි වැදී මුහුදට වැටෙන තිසල් සමඟින් සතුරාගේ දියණියද මුහුදට පැන තිසල්ට සහයෝගය දක්වන්නේ පියාගේ අසාධාරණ අමනකම්වල විරුද්ධත්වය පාමිනි. අවසානයේ තිසල්ගේ මූලිකත්වයෙන් තම පැරණි අහිංසක පෙම්වතා මුණ ගැසෙන දියණිය ඔහු හා එකතු වේ. චිත්‍රපටිය අවසාන වන්නේ දියණිය විසින් පියාට එවන ලද ලිපියකිනි. ඒ තමාට හොඳ පියෙකු වෙනවාට වඩා සමාජයට හොඳ මිනිසෙකු වන ලෙසය. එය අරාජිකත්වය ට ගමන් කරන අපේ රටට අද කාලයට ඔබින කදිම පණිවිඩයකි.

එහෙත් සෙනසුරු මාරුව තුළ බොහෝ අතාත්වික අභව්‍ය සිනමා ලක්ෂණ දැකිය හැකි බව නොකියාම බැරිය. එයින් එකක් නම් තිසල් එදා කොටින්ගෙන් කිහිපවරක්ම තම ජීවිතය බේරාගත් ඩග්ලස් දේවානන්ද ඇමතිවරයා සේ තම ජීවිතය බේරාගන්නා සැටිය. ඩග්ලස් සටන් නොකර තම වාසනා මහිමය නිසාම ජීවිතය බේරාගත්තද තිතටම වැඩදෙන දේශපාලන පාතාලයන් සමග තිසල් තනිවම සටන් කර ඔවුන්ගෙන් ්බේරෙන හැටි පුදුමය. කතාව තුළ ඔහු මරා දමා කතාව අබලන් කිරීමට නොහැකි වුවද බොරුව මතුවන විට චිත්‍රපටිය තරමක් දුරට හෝ මිය යන බව අධ්‍යක්ෂවරයාට අමතකව ගොස් ඇත. නවක සංගීත අධ්‍යක්ෂකවරයා ගේ සිනමා සංගීතය තුළින් එතරම් පෙළහරක් පෑමට සෙනසුරු මාරුව තුළින් නොහැකිවීම ගැන ද තරමක් දුරට සිතා බැලිය යුතුය. කලකට පසු හමුවන නදීකා ගුණසේකරගේ මවකගේ බිරිඳකගේ චරිතය තුළින් ඇයට මීට වඩා ප්‍රබලව යමක් කළ හැකි





ළබන කළාපයේ

"**බෝගල ගේ කතා**" දැන් තිසර ගුවන් විදුලියේ
www.sannasa.net ඔස්සේ හෝ ඔබේ දුරකතනයෙන් තිසර හා එක්වන්න



A.T. PARTNERS
Accountants & Business Advisors Pty Ltd

SOLE TRADERS !!!
SMALL BUSINESS OWNERS !!!

ARE YOU PAYING **MORE TAX** THAN YOU SHOULD?

LET US HELP YOU
**RESTRUCTURE YOUR BUSINESS**
**REDUCE YOUR TAX BURDEN**

- ✓ TAX PLANNING & BUSINESS ADVISE
- ✓ NEW BUSINESS REGISTRATION & COMPANY/FAMILY TRUSTS SETUPS
- ✓ INSTALLATION , SETUP & TRAINING OF ACCOUNTING SOFTWARE
- ✓ BAS, IAS, PAYG PREPARATION & LODGEMENT
- ✓ ASIC & ATO LIAISON, PAYMENT PLANS & TAX AMENDMENTS
- ✓ **INDIVIDUAL TAX RETURNS - $88* PER RETURN , 14 DAYS REFUND**
- ✓ TAX RETURNS FOR PARTNERSHIPS, COMPANIES, SMSFS & TRUSTS
- ✓ ADVISE ON NEGATIVE GEARING RE: SHARES & PROPERTY
- ✓ RENTAL PROPERTY & DEPREICIATION SCHEDULES
- ✓ ADMINISTRATION & COMPLIANCE OF SELF MANAGED SUPERANNUATION FUNDS

**CALL ACHINI TODAY** TO BOOK AN INITIAL **FREE** CONSULTATION ON

**0468 747 574** OR **03 8768 8630**

WE ARE IN YOUR FRIENDLY NEIGHBORHOOD AT **23 TOBIN WAY LYNDHURST**

**EVENING & WEEKEND APPOINTMENTS AVAILABLE**

**www.atpartners.com.au**